# තාක්ෂණික ආයතනය
# මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව



# වාර්ෂික වාර්තාව
## හා
# වාර්ෂික ගිණුම්
# 2015

(**2016-05-19** දින පැවති **184** වෙනි කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලදී.)

# දැක්ම

තාක්ෂණික අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්කිරීම.

# මෙහෙවර ප්‍රකාශය

කලාපයේ ක්‍රියාශීලී තාක්ෂණික ආයතනයක් බවට පත්කිරීම මෙන්ම ශ්‍රී ලාංකීය ප්‍රජාවගේ අධ්‍යාපනය, ආර්ථික සහ සමාජීය දියුණුව සඳහා සක්‍රීය දායකත්වයක් ලබාදීම.

- සමාජයේ සහ කර්මාන්තකරණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ලගාවිය හැකි, නම්‍යතාවයෙන් යුතු කාර්යක්ෂම තාක්ෂණික අධ්‍යාපනයක් සහ පුහුණුව ලබාදීම.
- නව්‍යකරණ සහ නිර්මාණශීලී පරිසරයක් ගොඩනැගීම.
- වෘත්තීය අවශ්‍යතා සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය සහ ව්‍යාපාරික ප්‍රජාව සමග ක්‍රියාශීලි සංවාදයක් ඇතිකිරීම.
- තරුණයින්හට සමාජයීය ආර්ථික මාර්ගයන් සඳහා විවෘත වන අවස්ථාවන් පුළුල් කිරීම.

## ජාතික තාක්ෂණික පාඨමාලාවේ ඉතිහාසය පිළිබඳ කෙටි විස්තරයක් සහ මොරටුව විශ්වවිද්‍යාලය, තාක්ෂණික ආයතනය ස්ථාපිත කිරීම.

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවේ (එන්.ඩී.ටි) මුලාරම්භය මරදාන ලංකා කාර්මික විද්‍යාලයේ දී ඇතිවුන අතර එය 1940 ගනන් දක්වා වු කාලයකට දිව යනු ලැබේ. එහි ලන්ඩන් විශ්වවිද්‍යාලයේ බී.එස්.සී (ඉංජිනේරු) උපාධියට සිසුන් සූදානම් කරන, වර්ෂ හතරක තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවට අමතරව කනිෂ්ඨ කාර්මික නිලධාරි දෙවර්ෂ පාඨමාලාවන් ක්‍රියාත්මක කරන ලදී. කනිෂ්ඨ කාර්මික නිලධාරි පාඨමාලාව ඉතා හොඳ පිළිගැනිමක් ලද මධ්‍යම මට්ටමේ පාඨමාලාවක් වු අතර මෙම පාඨමාලාව අවසන් කළ අය රටේ ඉංජිනේරු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා බොහෝ සෙයින් දායක වූහ.

1960 වර්ෂයේදී මොරටුව, කටුබැද්දෙහි ප්‍රායෝගික තාක්ෂණික ආයතනය පිහිටුවීමත් සමගම කනිෂ්ඨ කාර්මික නිලධාරී (එන්.ඩී.ටී) පාඨමාලාව මරදානේ සිට මොරටුවට මාරුකරන ලදී. කැනඩා රජයේ ආධාර ඇතිව (අයි.පී.ටී) පිහිටු වුයේ ප්‍රායෝගික මූලාශ්‍ර සහිත මධ්‍යම මට්ටමේ ඉංජිනේරු තාක්ෂණ පාඨමාලා නිර්මාණය කිරීම සහ ක්‍රියාත්ම කිරීමටය.

1966 වර්ෂයේ දී ප්‍රායෝගික තාක්ෂණික ආයතනය, ලංකා කාර්මික කොලීජිය ලෙස උසස් කරන ලද අතර පාඨමාලා ව්‍යාප්තියත් සමගම වේගවත් සංවර්ධනයක් ද ඇතිවිය. ලංකා තාක්ෂණික කොලීජිය වර්ෂ පහක කාලයක් සඳහා වු තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කරන ලදී. තවද ජේ.ටී.ඕ පාඨමාලාව සංශෝධනය කොට යාන්ත්‍රික පුහුණුවක්ද ඇතුලත් කොට, එය වසර තුනක ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් බවට පත් කරන ලදී. මේ සංවර්ධන ක්‍රියාකාරීත්වයත් සමඟ, ලංකා තාක්ෂණික (සී.සී.ටී) එකම විශ්වවිද්‍යාලය යටතේ වු, මණ්ඩපයක් බවට 1972 දී උසස් කරන ලදී. එතැන් සිට උසස් අධ්‍යාපන අමාත්‍යංශය වෙනුවෙන් එන්.ඩී.ටී පාඨමාලාව, විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලැබීය. 1987 දී එන්.ඩී.ටී පාඨමාලාව, 1978 අංක 16 දරණ පනත අනුව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාඨමාලාවක් බවට පත්වු අතර මෙම පාඨමාලාවට ඇතුලත් වීමේ සුදුසුකම් වුයේ ජී.සී.ඊ උසස් පෙළ සමත්වීමය. මොරටුව විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මකවන (අයි.ටී.යු.එම්) 2000 වසරේ අංක 3 දරණ ආඥ පනත යටතේ ස්ථාපිත කරන ලද්දේ එන්.ඩී.ටී සහ එයට සමාන්තර පාඨමාලා මූලික වශයෙන් ක්‍රියාත්මක කිරීමටය. තාක්ෂණික ආයතනය, කළමණාකරන මණ්ඩලයක් යටතේ ක්‍රියාත්මක වන අතර, පාඨමාලාවල ස්වාධීන සංශෝධනයන් සඳහා ඉවහල්වන, භෞතික වශයෙන් වෙන්ව පිහිටුවන ලබන ආයතනයක් ලෙස පිහිටුවීමේ, කාර්ය භාරය ඉටුවීම එම මණ්ඩලයෙන් අපේක්ෂා කෙරේ. ජේ.ටී.ඕ / එන්.ඩී.ටී සම්පූර්ණ කරන ලද අය ජාතියේ සංවර්ධන ක්‍රියාවලියට අතිවිශාල වශයෙන් දායකත්වයක් ලබා දෙති, එන්.ඩී.ටී පාඨමාලාවෙන් පුළුල් අධ්‍යාපනයක් සහ පුහුණුවක් ලබා දෙන අතර මධ්‍යම මට්ටමේ කාර්මික කටයුතු ඉටුකිරීමට අවශ්‍ය හැකියාවන්ද ලබාදෙයි. තවද එය වැඩිදුර ශක්තිමත් පදනමක් ද ඇති කරනු ලැබේ. රටේ පවත්නා මධ්‍යම මට්ටමේ පාඨමාලාවල තත්වය මනින මිනුම් දණ්ඩයක් බවටද මනා පිළිගැනීමක් ලෙස එන්.ඩී.ටී පාඨමාලාව පත්ව ඇත.

## ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන පිළිබඳ කෙටි හැඳින්වීමක්

මෙම පාඨමාලාවේ මූලික අරමුණ වනුයේ අප රටෙහි කාර්මික ක්ෂේත්‍රයට අවශ්‍ය වන විවිධ ක්ෂේත්‍රවලට අදාල ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් බිහිකිරීමය. ආයතනය ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන, **350** මුළු ශිෂ්‍ය සංඛ්‍යාවකට විෂයධාරා නමයක් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. අදාල විස්තර පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| රසායනික ඉංජිනේරු තාක්ෂණය | **25** |
| සිවිල් ඉංජිනේරු තාක්ෂණය | **80** |
| විදුලිය ඉංජිනේරු තාක්ෂණය | **40** |
| විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය | **40** |
| නාවික ඉංජිනේරු තාක්ෂණය | **15** |
| යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය | **60** |
| නාවුක අධ්‍යයන තාක්ෂණය | **15** |
| පොලිමර් තාක්ෂණය | **25** |
| පේෂකර්ම හා රෙදිපිළි තාක්ෂණය | **50** |

මෙයට අමතරව හමුදාවන්ට සහ විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්‍යය මණ්ඩලය සඳහා ශිෂ්‍යයින් පස් දෙනෙක් උපරිම වශයෙන් ඇතුලත් කර ගැනීමට ඉඩ සලස්වනු ඇත.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම එයටම ආවේනික වූ ක්‍රියාවලියක් තුලින් සිදුවේ. රජයේ ගැසට් පත්‍රයේ තෝරාගත් ප්‍රතිපත්ති පත්‍ර සහ වෙබ් අඩවිය තුල පළවන ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. පසුගිය ජී.සී.ඊ උසස් පෙළ අඛණ්ඩව තෙවරක් පෙනී සිටි සිසුන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති. ඉසෙඩ් ස්කෝර් දිස්ත්‍රික්ක / විශේෂ කුසලතා වෙන්කිරීම (විශ්වවිද්‍යාල ඇතුළත් කිරීම් මෙන්) සහ විවිධ විෂය ධාරාවන්ට ඇති ඔවුන්ගේ මනාපය පදනම් කරගත් ශිෂ්‍යයින් ඇතුලත් කරගනු ලැබේ.

පරිපූර්ණ ඩිප්ලෝමාධාරියකුගෙන් මූලිකව අපේක්ෂා කරනුයේ වෘත්තිමය ඉංජිනේරුවරයකු හෝ කළමනාකරුවකු සහ ක්ෂේත්‍රය / වැඩපල මට්ටමේ ශ්‍රම බලකාය අතර පවත්නා සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීමයි. මෙම ක්‍රියාදාමය තුලින් ඩිප්ලෝමාධාරියාට තමන් වෘත්තීමය ලෙස හැඩගස්වා ගැනීමටත් සම්බන්ධීකරණ සහ කළමනාකරණ කුසලතාවයන් දියුණු කරගැනීමටත් අවශ්‍ය වේ. ඔහු / ඇය තමා තෝරාගත් විෂය ක්ෂේත්‍රය පිළිබඳ මනා අවබෝධයක් ලබාගත යුතුය. මෙම අවබෝධය තුලින් ඔහු / ඇය වෘත්තීමය ඉංජිනේරුවරයකුගේ නව්‍යකරණය / නිර්මාණ ඇගයීමට හැකිවන අතර තම සහායකයින් සමග අදහස් හුවමාරුකර නව්‍යකරණය / නිර්මාණය යථාර්ථයක් බවට පත්කල හැකිවනු ඇත.

මෙම පාඨමාලාව දෑ අවුරුදු අධ්‍යයන කටයුතු සඳහා වන අතර එක් අවුරුදු කර්මාන්ත පුහුණුවකින්ද සමන්විතය. පළමු වසරට අදාල විෂයයන් සමාන්තර බව, ස්ථාවරත්වය සහ මූලික විද්‍යාවන් පිළිබඳ ශිෂ්‍යයාගේ දැනුම සහ ඔහු / ඇය තෝරාගනු ලැබූ විශේෂ විෂයධාරා

අධ්‍යයනය හඳුන්වා දීම සඳහාය. මෙය ඉංජිනේරු විද්‍යා අභ්‍යාස සඳහා අවශ්‍ය මූලික කුසලතාවයන් හෙළිදරව් කරනු ඇත. (උදා: වැඩපොල තාක්ෂණ ඉංජිනේරු සැලසුම්) එක් විෂය ධාරාවක් සඳහා ශිෂ්‍යයා විසින් තෝරාගනු ලැබූ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාල එකක් හෝ ඊට වැඩි ක්ෂේත්‍ර විෂයයක් ලබාදෙනු ඇත. (උදා: සිවිල් ඉංජිනේරු විෂය ධාරාව සඳහා සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය විසින් ගොඩනැගිලි ඉදිකිරීම උගන්වනු ලැබේ.)

පහත සඳහන් කරුණු හේතුවෙන් පළමු වසරේදී ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය වේ.

1 ඩිප්ලෝමාධාරියකුගේ වෘත්තීයෙන් සම්බන්ධීකරණ කටයුතු ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි. එනිසා සිසුන් තම අවබෝධ කර ගැනීම, කථනය, සහ වාර්තා ලිවීම පිළිබඳ කුසලතාවයන් වැඩි දියුණු කර ගත යුතුය.

2 ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව මුළුමුනින්ම ක්‍රියාත්මක කෙරෙනුයේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. බොහෝ සිසුන් ජී.සී.ඊ උසස් පෙළ දක්වා තමන්ගේ ඉගෙනීම් කටයුතු කර තිබෙන්නේ සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් වන හෙයින් ඒ අයගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීනත්වය බොහෝ සෙයින් වෙනස් වන අතර දියුණු කර ගැනීමට බොහෝ ඉඩකඩ ඇත.

දෙවන වසරේ විෂයයන් තුල ප්‍රධාන වශයෙන් ඇතුළත් වනුයේ තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍ර තුල විවිධ ඉංජිනේරුමය න්‍යායාත්මක සිදුවීම්වල නිරතව සිටිමය.

තෙවන වර්ෂය යොදාගෙන ඇත්තේ කර්මාන්තයෙහි නිරතවී ලබන අත්දැකීම් ලබා ගැනීම සඳහාය. පිලිගත් කර්මාන්ත ආයතනයන්හිදී ලබාදෙන පුහුණුව සංවිධානය කරනු ලබන්නේ සහ අධීක්ෂණය කරනු ලබන්නේ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සහ මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ කර්මාන්ත පුහුණුව භාර කථිකාචාර්යවරයා විසිනි.

වසර 3 ක ඉගෙනීමෙන් සහ පුහුණුවීමෙන් අනතුරුව සමත්වන සිසුන් හට විශ්වවිද්‍යාලය විසින් අනුමත කර ඇති කුසලතා නිර්නායක අනුව සාමාන්‍ය, සම්මාන හෝ විශිෂ්ඨ වශයෙන් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ.

ලකුණු අනුව නිරීක්ෂනය කෙරෙන අධ්‍යයනයකදී හෙළිදරව් වී ඇති පරිදි ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව ලබායන අයගෙන් එසේ අධ්‍යයන කටයුතු අවසන් කර වසරක් තුල රැකියා නියුක්ත වීම 100% බව පෙන්නුම් කෙරේ.

මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ අංශයේ දැනට ක්‍රියාත්මක වන නව විෂය කලාව ඉදිරිපත් කරනු ලැබුවේ 2005 වර්ෂයේ දී පළමු වසර සිසුන් සඳහා වන අතර දෙවන වසර සිසුන් සඳහා 2006 වර්ෂයේදී ය. එහි අරමුණ වූයේ, කර්මාන්ත ලෝකයේ වර්තමාන තාක්ෂණ දියුණුව හා සමගාමීවන, සිසුන් තෝරාගත් විෂයධාරාවන්හි ඔවුන්ගේ දැනුම පුළුල් කිරීමය.

## අධ්‍යක්ෂතුමියගේ කාර්ය සමාලෝචනය

### (අ) කෙටි හැඳින්වීම

ජාතික හා ජාත්‍යන්තර වශයෙන් මනා පිලිගැනීමක් ඇති ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (එන්.ඩී.ටී) අධ්‍යයන වැඩ සටහන පවත්වාගෙන යෑම සඳහා, මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය, ප්‍රධාන වශයෙන් වගකිව යුතු ප්‍රමඛ පෙලේ උසස් අධ්‍යාපන ආයතනයකි.

2015 වර්ෂයේ දී ආයතනය ස්වකීය 15 වන වසරට පා තැබීය. ආයතනයට අවශ්‍ය භෞතික පහසුකම් නොමැති නිසා මොරටුව විශ්වවිද්‍යාලයේ පවත්නා පහසුකම් බෙදාවෙන්කර උපයෝගී කර ගැනීම හේතුවෙන් ආයතනයේ කටයුතු පවත්වා ගැනීම සඳහා බොහෝ හේතුවෙන් ආයතනයේ කටයුතු පවත්වා ගැනීම සඳහා බොහෝ අපහසුතාවයන්ට ආයතනය අඛණ්ඩව මුහුණ දීමට සිදුවුවද සමාලෝචනයට යොමුවන වර්ෂය තුලදී ආයතනය, ස්වකීය අපේක්ෂිත ජාතික සේවාව ඉතා විශිෂ්ඨ ලෙස අඛණ්ඩව ඉටු කරන ලදී.

### (ආ) ජයග්‍රහන

2015 ජනවාරි මස පාඨමාලා නමයක් සඳහා සිසුන් 350 ක් ආයතනයට ඇතුළත් කරන ලදී. එම පාඨමාලා නම් රසායන, පේෂකර්ම, පොලිමර්, සිවිල්, විදුලිය, ඉලෙක්ට්‍රොනික, නාවික, යාන්ත්‍රික සහ නාවුක වශයෙනි. නවක සිසුන් සඳහා වූ නම්නීකරණ වැඩසටහන සහ කඩිනම් ඉංග්‍රීසි පංති පැවැත්වීම සාර්ථකව සිදු කරන ලදී. ආයතනයේ අධ්‍යයන ක්‍රියාකාරකම් අදාල අධ්‍යයන වැඩසටහන් ලේඛන අනුව ක්‍රියාත්මක කරන ලදී. ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිම කරන ලද සිසුන්ට ඩිප්ලෝමා ප්‍රදානය කිරීම සඳහා වූ ඩිප්ලෝමා ප්‍රදාන උත්සවය නියමිත අවස්ථාවේදී පවත්වන ලදී. සැලසුම් කරන ලද පරිදි තෙවන වර්ෂ සිසුන් සඳහා කාර්මික පුහුණු වැඩසටහන, ජාතික ආධුනිකත්ව කාර්මික පුහුණු අධිකාරියේ සම්බන්ධීකරණ ඇතිව පවත්වන ලදී.

සමාලෝචනයට යොමුවන වර්ෂයේ කැපි පෙනුන ජයග්‍රහනය වුයේ උසස් අධ්‍යාපන ආයතනයත් ICC පුද්ගලික සමාගමත් අතර අදාල ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව මොරටුව විශ්වවිද්‍යාලය, තාක්ෂණික ආයතනය ප්‍රතිස්ථාපනය කිරීම සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය හෝමාගම දියගම පරිශ්‍රයේදී ආරම්භ වීම සහ අඛණ්ඩව පවත්වාගෙන යෑමයි. 2015 වර්ෂය අවසන්වන විට ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය සහිත ප්‍රධාන අධ්‍යයන ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතුවල 75% වැඩි ප්‍රමානයක් අවසන් කිරීමට හැකි විය. ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහනේ විෂය මාලා සංවර්ධන ක්‍රියාවලියට අදාල වැඩ කටයුතු 2015 වර්ෂය තුලදී ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩල පුහුණුවීම් යටතේ ආරම්භ විය.

### (ඇ) අසාර්ථකවීම සහ සාධාරණීයකරණය

මොරටුව විශ්වවිද්‍යාලය, තාක්ෂණික ආයතනය 2000 වර්ෂයේ ආරම්භ වූ දා සිටම එහි ප්‍රමානාත්මක සහ ගුණාත්මක සංවර්ධනයක් කිරීමට නොහැකිවූයේ ආයතනය බොහෝ සෙයින් අපහසුතාවයන්ට මුහුණ දුන් හෙයිනි. විශ්වවිද්‍යාල සමග පවත්නා පහසුකම් වෙන්කර ගැනීමේදී ඇතිවුනු සීමාවන් හේතුවෙන් වාර්ෂිකව ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වන 350, දශක තුනක කාලසීමාවක් තුල එලෙසම පැවතුන අතර 2015 වර්ෂයේදී ද එම සංඛ්‍යාව එපරිද්දෙන්ම පැවතුනි. විෂය මාලාවේ පුනරීක්ෂණයක් තුලින් හඳුනාගනු ලැබූ අධ්‍යාපන මට්ටම උසස් කිරීම, මුළුමුනින්ම ක්‍රියාත්මක කිරීම, මතු සඳහන් හේතුව නිසාම, කාර්ය මණ්ඩලයටත් සිසුන්ටත් අපහසු කාරනයක් විය. දිර්ඝ කාලීනව පැවත එන මෙම බාධකයන්ට හොඳම විසඳුම වනුයේ අපේක්ෂිත පරිදි ආයතනය නව ස්ථානගතකොට සංවර්ධනය කිරීමය.

### (ඈ) අනාගත සැලැස්ම

ආයතනයේ අනාගත සැලසුම් පොදුවේ රැඳී ඇත්තේ " මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය නව ස්ථානගත කිරීම සහ සංවර්ධනය" කිරීමේ මූලික සංවර්ධනය ව්‍යාපෘතියක් සමගය. මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සඳහා ඇතුලත් කර ගැනීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව 350 සිට 1000 දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත. එමෙන්ම තොරතුරු තාක්ෂණය, ප්‍රමාණ සමීක්ෂණ, යාන්ත්‍රික විද්‍යුතය සහ ගුවන් ඉංජිනේරු තාක්ෂණය වැනි විෂය ධාරාවන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා වැඩ සටහනට ඇතුලත් කිරීමටද සැලසුම් කර ඇත. ඒ සමගම ජාතික තාක්ෂණික වැඩසටහන සාර්ථකව නිමකළ සිසුන්හට පශ්චාත් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩ සටහනක්ද ආරම්භ කිරීමටද සැලසුම් කර ඇත.මෙම අරමුණ සාක්ශාත් කර ගැනීම සඳහා උනන්දුවක් දක්වන සියලුම දෙනා සක්‍රීයව දායකත්වය ලබා දෙමින් කටයුතු කරන අතර මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණ ආයතනය දැනට පවත්නා ශිෂ්‍ය සංඛ්‍යාව සමගින් පවත්නා ක්‍රමය තුල ඇති සාධනීය අවස්ථා උපයෝගී කර ගනිමින් ගුණාත්මක භාවයෙන් වැඩි ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව ක්‍රියාත්මක කිරීමේ ජාතික වගකීම අඛණ්ඩව කරගෙන යනු ඇත.

ව්‍යාපෘති විෂය පථය

- ශ්‍රී ලංකාවේ හෝමාගම, දියගම පරිශ්‍රයේ නව ගොඩනැගිලි සංකීර්නයට යටිතල පහසුකම් ලබාදීම.
- දේශන ශාලා සහ පරිපාලන සංකීර්නයට අවශ්‍ය උපකරන සහ දැව භාණ්ඩ, කර්මාන්ත ශාලා සඳහා අවශ්‍ය රසායනාගාර උපකරන, යන්ත්‍ර සූත්‍ර සහ උපකරන, තොරතුරු තාක්ෂණ උපකරන රථවාහාන ආදිය සැපයීම සහ සවිකිරීම.
- කාර්ය මණ්ඩල පුහුණුව සහ විෂය මාලා සංවර්ධනය.

# පටුන


| | | |
|---|---|---|
| **1** | තාක්ෂණික ආයතනයේ  අරමුණු | **1** |
| **2** | ආයතනයේ කළමනාකරණ මණ්ඩලය | **2** |
| **3** | ආයතනයේ නිළධාරීන් | **3** |
| | **3.1** සංවිධාන සැලැස්ම | **4** |
| **4** | කාර්ය මණ්ඩල සහ සිසුන් පිළිබඳ විස්තර | **5** |
| | **4.1** දේශිය සිසුන් පිළිබඳ විස්තර | **6** |
| | **4.2** විදේශිය සිසුන් පිළිබඳ විස්තර | **6** |
| | **4.3** අධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර | **7** |
| | **4.4** අනධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර | **7** |
| **5** | පර්යේෂණ, නව නිපැයුම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර | **8** |
| **6** | වැඩසටහන්, සම්මන්ත්‍රන සහ වැඩමුළු  පිළිබඳ විස්තර | **12** |
| **7** | ලබාගත් ප්‍රදාන පිළිබඳ විස්තර | **13** |
| **8** | ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර | **13** |
| **9** | පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | **14** |
| **10** | මූලධන වියදම් පිළිබඳ විස්තර | **14** |
| **11** | ව්‍යාපෘති විස්තරය (දේශීය / විදේශීය ප්‍රතිපාදන) | **14** |
| **12** | ව්‍යාපෘති වැය විස්තරය (දේශීය / විදේශීය ප්‍රතිපාදන) | **15** |
| **13** | මූල්‍ය ප්‍රගති විස්තරය (වියදම්) | **15** |
| **14** | මූල්‍ය ප්‍රගති විස්තරය (උත්පාදන) | **15** |
| **15** | මූල්‍ය ප්‍රගති විශ්ලේෂණය - **2015** | **16** |
| **16** | **2015** වර්ෂයේදී ලැබුනු යටිතල පහසුකම් විස්තරය | **16** |
| **17** | තාක්ෂණික ආයතනය ප්‍රතිස්ථාපනය කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | **16** |
| **18** | වෙනත් විස්තර | **16** |
| **19** | විගනනය කරන ලද මූල්‍ය ප්‍රකාශන | **17** |
| **20** | විගණන කොමිටු වාර්තාව | **21** |
| **21** | විගණකාධිපතිවරයාගේ වාර්තාව | **22** |
| **22** | විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු | **29** |

# 1. ආයතනයේ අරමුණු

- ❖ නූතන, පශ්චාත් - ද්විතියික තාක්ෂණික ආයතනයක් සමග අනුකූල වන භෞතික පරිසරයක් ස්ථාපිත කිරීම.
- ❖ සමාජයේ සහ කර්මාන්තකරණයේ අවශ්‍යතාවයන් සපුරාලිය හැකි මහත්වූ ශිෂ්‍ය ප්‍රජාවට නම්‍යතාවයෙන් ලගාවිය හැකි ඉගැන්වීමේ සහ කුසලතා පුහුණු කිරීමේ ක්‍රම වේදයක් නිර්මාණය කිරීම.
- ❖ ප්‍රායෝගිකව උචිත වන පර්යේෂණ දිරිගැන්වෙන පරිසරයක් ස්ථාපිත කිරීම සහ නව්‍යකරණ සහ නිර්මාණශිලිත්වය සඳහා උනන්දු කරවීම.
- ❖ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක ශක්තිමත් වූ හවුල් සබඳතාවයක් ගොඩනැගීම සහ කර්මාන්තයන්හි නියැලීම
- ❖ සුදුසුකම් ලත් ක්‍රියාශිලි කණ්ඩායමක් වර්ධනය කිරීම
- ❖ ශිෂ්‍යයින්ගේ පූර්ණ සංවර්ධනයක් ප්‍රවර්ධනය කෙරෙන පරිසරයක් නිර්මාණය කිරීම
- ❖ ආයතනයේ සියළුම ක්ෂේත්‍රයන්හි තත්වය සහ කාර්යක්ෂමතාවය සහතික කෙරෙන කළමනාකරණ පද්ධතියක් වර්ධනය කිරීම.

## 2. ආයතනයේ කළමනාකරණ මණ්ඩලය


| | | | |
|---|---|---|---|
| 1 | එම්.එම්.පි.ඩී | සමරසේකර මහත්මිය | අධ්‍යක්ෂ - තාක්ෂණික ආයතනය |
| 2 | පි.ජී | ජයසිංහ මහතා | උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්තුමාගේ නාමිත |
| 3 | ඒ.ඩබ් | සෙනෙවිරත්න මහතා | නාවික විෂයභාර ඇමතිතුමාගේ අමාත්‍යාංශ ලේකම්තුමාගේ නාමිත |
| 4 | ආර්.එම්.ඒ.පි | සමරදිවාකර මහත්මිය | ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරියේ සභාපතිතුමාගේ නාමිත |
| 5 | මහාචාර්ය යූ.ජී.ඒ | පුස්වැවල | පීඨාධිපති, ඉංජිනේරු පීඨය |
| 6 | මහාචාර්ය එම්.එල් | ද සිල්වා | පීඨාධිපති, වාස්තු විද්‍යා පීඨය |
| 7 | ඉංජිනේරු මංගල | පි.බි යාපා | පාලක සභා නියෝජිත (06.05.2015 සිට 05.05.2018 දක්වා) |
| 8 | මහාචාර්ය එස්.එම්.ඒ | නානායක්කාර | සභාතන සභා නියෝජිත |
| 9 | ආචාර්ය ටී.ඒ.ජී | ගුණසේකර | මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ නියෝජිත |
| 10 | පි.එන්.පි | ෆොන්සේකා මහත්මිය | |
| 11 | ආචාර්ය ඒ.එම්.එන් | අලගියවන්න | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නියෝජිත (30.04.2015 සිට 29.04.2018 දක්වා) |
| 12 | ජේ.කේ | ලංකාතිලක | |

## 3. ආයතනයේ නිළධාරීන්

| | |
|---|---|
| අධ්‍යක්ෂ | එම්.එම්.පි.ඩි සමරසේකර මහත්මිය<br>*B.Sc. (Eng.) (Moratuwa),*<br>*M. Eng. (Moratuwa),*<br>*MPhil (Moratuwa)* |
| නියෝජ්‍ය ලේඛකාධිකාරි | කේ.සි සංජිවනී පෙරේරා මහත්මිය<br>*BSc. (Hons)(Sri J' pura),*<br>*PGDBM (Colombo)*<br>*MBS (Merit)(Colombo)* |
| නියෝජ්‍ය මුලාධිකාරි | පුරප්පාඩුවී ඇත. |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | එස්.ආර්.එස් උදේශි මහත්මිය<br>*BSc. (Agri.) (Ruhuna)*<br>*Mphil (Agri.) (Peradeniya)* |
| ජ්‍යෙෂ්ඨ සහකාර මුලාධිකාරි | එස්.පි.ඩි පිරිස් මහත්මිය<br>*B.Com (Sp)-KLN,*<br>*PGDIP (Pub. Mgt.)-SLIDA,*<br>*CBA* |
| තැපැල් ලිපිනය | තාක්ෂණික ආයතනය<br>මොරටුව විශ්වවිද්‍යාලය<br>කටුබැද්ද,<br>මොරටුව,<br>ශ්‍රී ලංකාව. |

| | | |
|---|---|---|
| දුරකථන අංක | පොදු | :011 2650301/340 /441/534/671 |
| | ෆැක්ස් | : 011 2650565 |
| | අධ්‍යක්ෂ | : 011 2650064 |
| | නියෝජ්‍ය ලේඛකාධිකාරි | : 011 2650427 |
| | ජ්‍යෙෂ්ඨ සහකාර මුලාධිකාරි | : 011 2650565 |

# 3.1 සංවිධාන සැලැස්ම - 2015



## 4. කාර්ය මණ්ඩල සහ සිසුන් පිළිබඳ විස්තර

| අධ්‍යයන අංශ | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| සිවිල් ඉංජිනේරු තාක්ෂණ | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | 244 | කථිකාචාර්යවරු<br>P –05<br>V- 04<br>උපදේශකවරු<br>T – 04<br>V-08 | P- 01 |
| යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | 251 | කථිකාචාර්යවරු<br>P – 07<br>C- 01<br>V- 06<br>APO – 02<br>IMarEST L -06<br>උපදේශකවරු<br>T – 04<br>V – 20 | P- 01 |
| පොලිමර්, රෙදිපිළි සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | 283 | කථිකාචාර්යවරු<br>P – 09<br>V- 08<br>උපදේශකවරු<br>T – 04<br>V – 07 | T- 01 |
| විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | 237 | කථිකාචාර්යවරු<br>P – 07<br>V- 04<br>උපදේශකවරු<br>T – 11<br>V – 08 | T- 02 |
| අන්තර්විෂය මාලා අධ්‍යයනය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | 350 | කථිකාචාර්යවරු<br>P – 08<br>C- 01<br>T- 01<br>V- 02<br>උපදේශකවරු<br>T – 02<br>V – 02 | T- 02 |

P – ස්ථිර
C- කොන්ත්‍රාත්
T- තාවකාලික
APO - සහකාර ව්‍යාපෘති නිළධාරී
IMarEST L - IMarEST කථිකාචාර්ය
V- බාහිර

## 4.1 දේශිය සිසුන් පිළිබඳ විස්තර

**ආයතනයට සිසුන් 350 ක් ඇතුලත් කරගනු ලබන අතර ක්ෂේත්‍ර 9 කින් සමන්විත වේ. එනම් රසායනික, පේෂකර්ම, පොලිමර්, සිවිල්, විදුලිය, විද්‍යුත් හා විදුලි සන්දේශ, නාවික, යාන්ත්‍රික හා නාවුක වේ.**

| අධ්‍යයන අංශය | පාඨමාලාව | මාධ්‍යය | සිසුන් ඇතුලත් කිරීම 2015 | පළමු වසර සිසුන් | දෙවන වසර සිසුන් | තෙවන වසර සිසුන් | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| සිවිල් ඉංජිනේරු තාක්ෂණ. | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 81 | 83 | **81** | **80** | **91** |
| යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 90 | 83 | **90** | **78** | **86** |
| පොලිමර්, රෙදිපිලි සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 100 | **101** | 94 | 94 | **99** |
| විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 80 | **78** | **84** | **75** | **92** |
| අන්තර්විෂය මාලා අධ්‍යයනය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | | | | | |
| එකතුව | | | **351** | **345** | **349** | **327** | **368** |

## 4.2 විදේශිය සිසුන් පිළිබඳ විස්තර

**ආයතනයට විදේශීය සිසුන් ඇතුළත් කරගනු නොලැබේ.**

## 4.3 අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

**ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය ස්ථිර සාමාජිකයන් 39 දෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යයන ක්‍රියාකාරකම් සඳහා කොන්ත්‍රාත්, තාවකාලික, සහ බාහිර කාර්ය මණ්ඩලය යොදවා ගනු ලැබේ.**

| අධ්‍යයන අංශය | විෂයය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | ඉංජිනේරු ඉගැන්වීම් සහයක | උපදේශක |
|---|---|---|---|---|---|---|---|---|
| සිවිල් ඉංජිනේරු තාක්ෂණ. | සිවිල් | ඉංග්‍රීසි | - | - | 04 | 02 | - | 03 |
| යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය | යාන්ත්‍රික හා නාවුක අධ්‍යයනය | ඉංග්‍රීසි | - | - | 04 | 02 | 01 | 04 |
| පොලිමර්, රෙදිපිළි සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය | පේෂකර්ම<br>පොලිමර්<br>රසායනික | ඉංග්‍රීසි | - | - | 03<br>**01**<br>- | **-**<br>01<br>03 | 01<br>-<br>- | 04 |
| විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය | විදුලිය<br>ඉලෙක්ට්‍රොනික | ඉංග්‍රීසි | - | - | -<br>- | 04<br>03 | -<br>- | **05**<br>**06** |
| අන්තර්විෂය මාලා අධ්‍යයනය | ගණිතය<br>තොරතුරු තාක්ෂණය<br>ඉංග්‍රීසි | ඉංග්‍රීසි | - | - | 02<br>**01**<br>01 | 02<br>**01**<br>03 | -<br>-<br>- | **01**<br>01<br>- |
| එකතුව | | | | | **16** | **21** | **02** | **24** |

## 4.4 අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

**ආයතනය පරිපාලනය අංශ 2කින් සමන්විත වේ . එනම් මුදල් හා සාමාන්‍ය පාලන අංශ වේ.**

| අංශය | අධි ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවක |
|---|---|---|---|---|
| මුදල් අංශය | - | 01 | 05 | - |
| සාමාන්‍ය පාලන අංශය | - | 03 | 08 | 04 |
| එකතුව | **-** | **04** | **13** | **04** |

# 5. පර්යේෂණ, නව නිපැයුම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

**මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් කරන ලද පර්යේෂණ කටයුතු වල සොයාගැනීම් දේශීය සහ විදේශීය වශයෙන් ඉදිරිපත් කර ඇති අතර හා ප්‍රකාශිතව ඇත.**

| කතෘවරු | පර්යේෂණ පත්‍රිකාවේ මතෘකාව | සම්මේලනය |
|---|---|---|
| සෝමරත්න එම්.සි.ඩබ්<br>ලියනගේ එන්.එම්.වි | ලවනයෙන් පරිපූර්ණ වූ යොදාගත් රබර් කිරිවල භෞතික ගුණාංග සංසන්ධනය කිරීම | මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික පර්යේෂණ සම්භාෂණය |
| ලියනගේ එන්.එම්.වි<br>සෝමරත්න එම්.සි.ඩබ්<br>වල්පොල එස් | ශ්‍රී ලංකා පෙටන්ට් බලපත්‍රය **17447.** විකිරණීය වූ රබර් කිරි ව්‍යාප්ත කිරීම සදහා ස්වභාවික රබර් කිරි වඩාත් ශක්තිමත් කිරීමේ ක්‍රමය. | |
| අබේකෝන් කේ.එම්.ඩබ්<br>පුංචිහේවා එම්.ඩබ්.කේ<br>නානායක්කාර එල්.ඩී.ජේ.එෆ්<br>මුනිදාස ජේ.ඩී | කායිකව වෙනස් අකාරයකට හැකියාවන් සහ සීමාවන් ඇති අය හදුනා ගැනීම සදහා කායික අපහසුතාවයන් වෙන්කර දැක්වීම | ජෙනරාල් ජෝන් කොතලාවල මැතිදුන්ගේ විශ්වවිද්‍යාලයෙහි **8** වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මේලනය 2015 |
| අබේකෝන් කේ.එම්.ඩබ්<br>පුංචිහේවා එම්.ඩබ්.කේ<br>නානායක්කාර එල්.ඩී.ජේ.එෆ්<br>මුනිදාස ජේ.ඩී | කායිකව වෙනස් අකාරයක හැකියාවන් ඇති අය සදහා කායික හැකියාවන් අධ්‍යයනය කිරීම. | මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික පර්යේෂණ සම්මේලනය |
| ජයතුංග ජී.කේ<br>අමරසිංහ බී.එම්.ඩබ්.ජී.කේ | සවිවර සහිත හෝ රහිත තනන ලද බට විසුරුනු පාත්තියක බහාලන ගම්මිරිස් ගණිතමය ආකෘතියක වියැලෙන වාලක | විවිධාකාර ව්‍යාපෘති සහ ආර්ථික පර්යේෂණ වල ප්‍රවනතාවයන් තායිලන්තයෙහි පැවති පර්යේෂණ සම්මේලනය. |
| ආචාර්ය දිසානායක ජී මිය<br>ආචාර්ය පෙරේරා එස් මිය | ග්‍රන්ථයක ජේදය -පෝෂණීය තන්තු සදහා වූ නව යොමු වීම් කෘතියෙහි නම විලාසිතා කර්මාන්ත සදහා පෝෂනීය තන්තු. | |
| වීරකෝන් ඒ.ඩී | දැන්වීම් ප්‍රදර්ශනය තුලින් ශිෂ්‍යයින්ගේ මුදු මොලොක් හැකියාවන් පිළිබද කුසලතාවයන් වර්ධනය කිරීම පහසු කිරීම. | මොරටුව විශ්වවිද්‍යාලය තාක්ෂණික ආයතනය වාර්ෂික පර්යේෂණ සම්භාෂණය. |

| කතෘවරු | පර්යේෂණ පත්‍රිකාවේ මතෘකාව | සම්මේලනය |
|---|---|---|
| ගලබඩ හර්ෂා, හද්‍රානි තෝරදෙණිය, රංගිකා හල්වතුර | නාගරික එලිමහන් ඉදිකිරීම් සහ අදාල ඉදිකිරිම් උපකරණ පිළිබද මහජන සංජානනය. | වාස්තු විද්‍යා පිඨයේ පර්යේෂණ ඒකකයේ 8 වන ජාත්‍යන්තර සම්මේලණය - මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රි ලංකාව. |
| හද්‍රානි තෝරදෙණිය අයෝදා බුලත්සිංහල | පානීය ජලය සහ ගෘහස්ත ජලය පිළිබද මහජන සංජානනය, අත්හදා බැලීමේ අධ්‍යයනයක්. | කාර්මික සැසිය 2015 ඉංජිනේරුවන්ගේ ආයතනය ශ්‍රී ලංකාව |
| කාරියවසම් ඒ.බී තෝරදෙණිය | කුඩා ද්‍රව බලපැම්වල බලපැම්.මුලික අධ්‍යයනය තුලින් පර්යේෂණ සැලැස්මක් | ජෙනරාල් ජෝන් කොතලාවල මැතිදුන්ගේ විශ්වවිද්‍යාලයෙහි 8 වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මේලනය. |
| හද්‍රානි තෝරදෙණිය | ශ්‍රී ලංකා මා ඔය ගංගා නිම්න සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අධ්‍යයන භුවමාරු විශලේෂණය රාමුව භාවිතය. දකුණු ආසියාවේ ස්වභාවික සම්පත් කළමනාකරණයෙහි මුල්‍යමය වාසි පිළිබද අධ්‍යයනය. | Springer Science + Business Media Singapore |

| කතෘවරු | පර්යේෂණ පත්‍රිකාවේ මතෘකාව | සම්මේලනය |
|---|---|---|
| පි.එස් යටපාන<br>සුරියආරච්චි | විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා දෙආකාර යන ශ්‍රේණිගත කිරීම් යෙදවීම් සංසන්දනය. වසර කිහිපයක් සිටම පවතින විෂය මාලාව පදනම් කරගත් රාජ්‍ය විභාග ක්‍රමය තුල පොදු Currency Index ක්‍රමය හා ඉසෙඩ් ස්කෝර ක්‍රමය. | සංක්ෂේපය, මොරටුව විශ්වවිද්‍යාලය, තාක්ෂණික ආයතනය, පර්යේෂණ සම්භාෂණය -2015. |
| එස්.සී මතුගම<br>ටී.එස්.පී පීරිස් | ශ්‍රී ලංකාවේ ආනමඩුව ප්‍රදේශයේ ඉතා අවදානම් උෂ්ණාධික කලාපයක් කාල වකවානුව විශ්ලේෂණය. | සංක්ෂේපය - මොරටුව විශ්වවිද්‍යාලය, තාක්ෂණික ආයතනය, පර්යේෂණ සම්භාෂණය - 2015 |
| සී.පී.එන් ආටිගල | විශ්වවිද්‍යාලයේත් පූර්ව විශ්වවිද්‍යාල මට්ටමේදීත්, ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සිසුන්ගේ විභාග දක්ෂතාවයන් අධ්‍යයනය කිරීම. | සංක්ෂේපය - මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය -පර්යේෂණ සම්භාෂණය -2015. |
| එස්. නාගොඩවිතාන | භාෂා ප්‍රවර්ධනය සනිටුහන් කරන්නන් ලෙස සන්නිවේදන ක්‍රමෝපායයන් උපයෝගී කර ගැනීම අධ්‍යයනය කිරීම. | සංක්ෂේපය - මොරටුව විශ්වවිද්‍යාලය තාක්ෂණික ආයතනය- පර්යේෂණ සම්භාෂණය - 2015. |
| ඩී.ඩී.පී.ඒ.ඩී.එස් සපරමාදු | ගුවන්තොටුපල පර්යන්තයට පැමිණෙන මගීන්හට අනිවාර්ය සේවා මධ්‍යස්ථාන වලින් ලැබෙන සේවා ආදර්ශයන් අධ්‍යයනය කිරීම සහ අතරතුර ලැබෙන සේවාවන්හි බලපෑම. | සංක්ෂේපය - මොරටුව විශ්වවිද්‍යාලය - තාක්ෂණික ආයතනය - පර්යේෂණ සම්භාෂණය - 2015. |
| ඩී.ඩී.පී.ඒ.ඩී.එස් සපරමාදු<br>ජේ.එම්.එස්.ජේ බණ්ඩාර | ගුවන්තොටුපල පර්යන්ත වල අනිවාර්ය සේවා මධ්‍යස්ථාන අතරතුර අනිවාර්ය නොවන සේවා මධ්‍යස්ථාන පිහිටුවීමෙන් ඇතිවන බලපෑම. | අධිවේගී ධාවන ඉංජිනේරු විද්‍යා සහ ගමනා ගමන සේවා ක්‍රම පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය 2015 ගල්කිස්ස ශ්‍රී ලංකාව |
| කල්පනා ගලප්පත්ති | තොරතුරු තාක්ෂණ විෂය හැදින්වීම සඳහා වන ඉගැන්වීමේ ආදර්ශය. අපේක්ෂිත අභියෝග, උපයෝගී කරගනු ලබන ක්‍රමවේද සහ ඉගෙනගත් පාඩම් | සංක්ෂේපය - මොරටුව විශ්වවිද්‍යාලය - තාක්ෂණික ආයතනය - පර්යේෂණ සම්භාෂණය - 2015. |

| කතෘවරු | පර්යේෂණ පත්‍රිකාවේ මතෘකාව | සම්මේලනය | සගරා |
|---|---|---|---|
| **ජී.ඩබ්.ටී.සී කණ්ඩම්බි** | **සිමෙන්ති වලින් ස්ථායිකරනය කරන ලද සුමුදු වැල්ල - සිද්ධි අධ්‍යයනයක්** | **ඉංජිනේරුවන්ගේ ආයතනයේ වාර්ෂික සැසිය - ශ්‍රී ලංකාව ඔක්තෝබර් 2015** | **ඉංජිනේරුවන්ගේ ආයතනයේ සගරාව ශ්‍රී ලංකාව ඔක්තෝබර් 2015.** |
| **එස්.එම් කන්නන්ගර<br>එරන්ග ප්‍රනාන්දු<br>එස්.කේ කුමාරගේ<br>එන්.ඩබ්.එන් දයානන්ද** | **ලැපරොස්කොපික් ශල්‍යකර්ම උපකරන මතවූ උදරයේ අවයව පිළිබඳ සිමියුලේටරය තුලින් තොරතුරු ආපසු ලබාගැනීම.** | **-** | **ජීව විද්‍යාව, ජීව රසායන විද්‍යාව, සහ ජීව තොරතුරු දත්ත සැකසීමේ විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සගරාව 5 වෙලුම අංක 03, මැයි 2015.** |

## 6. වැඩසටහන්, සම්මන්ත්‍රන සහ වැඩමුළු පිළිබඳ විස්තර

| වැඩ සටහන් සම්මන්ත්‍රණ සහ වැඩමුළු | පැවැත්වූ දිනය / දිනයන් | සහභාගි වූවෝ | සංලක්ෂය |
|---|---|---|---|
| 1.මොරටුව විශ්වවිද්‍යාලය, තාක්ෂණික ආයතනය පර්යේෂණ සම්භාෂණය. | ජුලි 2015 | සියළුම අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ පරිපාලන කාර්ය මණ්ඩලය | වාර්ෂිකව පවත්වන්නකි. |
| 2. අඛණ්ඩ ඇගයීම් පිළිබද වැඩමුළුව | ජුලි 2015 | සියළුම අධ්‍යයන කාර්ය මණ්ඩලය | සම්පත් දායකයින් අචාර්ය ඩී.ඩී.ඩී සුරවීර ආචාර්ය පී.ඒබී.ඒ.ආර් පෙරේරා. |
| 3. කාර්යාල පුහුණු වැඩසටහන | ජුලි, අගෝස්තු 2015 | මොරටුව විශ්වවිද්‍යාලය තාක්ෂණික ආයතනයේ සියළුම කාර්ය මණ්ඩලය | මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය ප්‍රතිස්ථාපනය කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙහි කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ කොටස ක්‍රියාත්මක කිරීම. |
| 4. තක්සේරු කිරීමේ සහ ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටිය | සැප්තැම්බර් 2015 | මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ සියළුම කාර්ය මණ්ඩලය | සම්පත් දායක අනුර ලොකුගමගේ මයා |
| 5. දිරිගැන්වීමේ දේශනය | සැප්තැම්බර් 2015 | ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පළමු වසර සිසුන් | සම්පත් දායක මොහාන් පල්ලියගුරු මයා |
| 6. කර්මාන්තයෙහි රැදී සිටින්නේ කෙසේද? ආරාධිත දේශන | ඔක්තෝබර් 2015 | ජාතික තාක්ෂණ ඩිප්ලෝමා දෙවන වසර සිසුන් | සම්පත් දායකයින් රුක්මාල් ද සිල්වා සහ විකාශ් පිල්ලෙයි මහතුන් |
| 7. කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන II | නොවැම්බර් 2015 | සියළුම අධ්‍යයන කාර්ය මණ්ඩලය | මොරටුව විශ්වවිද්‍යාලය තාක්ෂණික ආයතනය ප්‍රතිස්ථාපනය සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙහි කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ කොටස ක්‍රියාත්මක කිරීම. |
| 8. කුසලතා එළිදැක්වීම | දෙසැම්බර් 2015 | ජාතික තාක්ෂණ ඩිප්ලෝමා නව ශිෂ්‍ය කණ්ඩායම 2015/2016 | නම්නීකරණ වැඩසටහනේ කොටසක් ලෙස ක්‍රියාත්මක කරන ලදී. |
| 9. මිණුම් කදවුර | දෙසැම්බර් 2015 | ජාතික තාක්ෂණ ඩිප්ලෝමා දෙවන වසර සිවිල් ඉංජිනේරු සිසුන් | වාර්ෂික වැඩ සටහනකි. |

## 7. ලබාගත් ප්‍රදාන පිළිබඳ විස්තර

**ඩිප්ලෝමා ප්‍රදාන උත්සවයේදී සිසුන් 69 දෙනෙකු විශිෂ්ඨ සමාර්ථ සහතික ලබාගන්නා ලදී.**

| | |
|---|---|
| **රසායන ඉංජිනේරු තාක්ෂණය** | **05** |
| **සිවිල් ඉංජිනේරු තාක්ෂණය** | **12** |
| **විදුලිය ඉංජිනේරු තාක්ෂණය** | **12** |
| **විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය** | **10** |
| **නාවික ඉංජිනේරු තාක්ෂණය** | **07** |
| **යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය** | **09** |
| **නාවුක අධ්‍යයන තාක්ෂණය** | **03** |
| **පොලිමර් තාක්ෂණය** | **07** |
| **පේෂකර්ම හා රෙදිපිලි තාක්ෂණය** | **04** |

## 8. ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර

**තාක්ෂණික ආයතනය දියගම ස්ථාපිත කිරීමෙන් පසු නව පාඨමාලා ආර්මභ කිරීමට යෝජිතය.**

## 9. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තරය :

| වැය විෂයය | 2014 (රුපියල්) | 2015 (රුපියල්) |
|---|---|---|
| පෞද්ගලික වේතන වියදම් | 93,526,6880 | 112,840,723 |
| ගමන් වියදම් | 86,103 | 469,675 |
| සැපයීම් වියදම් | 3,960,105 | 3,906,074 |
| නඩත්තු වියදම් | 2,549,932 | 1,518,939 |
| ගිවිසුම්ගත සේවා වියදම් | 3,832,023 | 1,719,164 |
| වෙනත් | 9,341,455 | 11,054,729 |
| එකතුව | **113,296,498** | **131,509,304** |

## 10. මූලධන වියදම් පිළිබඳ විස්තර :

| වැය විෂයය | 2014 (රුපියල්) | 2015 (රුපියල්) |
|---|---|---|
| අ. දැවභාණ්ඩ, රසායනාගාර සහ කාර්යාල උපකරණ | 7,825,841 | 6,071,461 |
| ආ. යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම් | 5,900 | 189,033 |
| ඇ. ගොඩනැගිලි සහ ව්‍යුහයයන් | 245,322 | 47,525 |
| ඉ. වෙනත් | 756,950 | 711,530 |
| එකතුව | **8,834,013** | **7,019,549** |

## 11. ව්‍යාපෘති විස්තරය (දේශිය / විදේශිය ප්‍රතිපාදන)

| නම සහ විස්තර | ණය/ ප්‍රතිපාදන | ප්‍රතිපාදන ආයතනය | TCE රු. | RFA රු. | DF රු. |
|---|---|---|---|---|---|
| තාක්ෂණික ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය ප්‍රතිස්ථාපනය කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | ණය | ශ්‍රී ලංකා රජය | මිලියන **10,239** | | |
| එකතුව | | | මිලියන **10,239** | | |

**#(ශ්‍රී ලංකා රජය / ආසියානු සංවර්ධන බැංකුව /ජාත්‍යන්තර සංවර්ධන ආයතනය/ ලෝක බැංකුව)**

## 12. ව්‍යාපෘති වැය විස්තරය (දේශිය / විදේශිය අරමුදල් ප්‍රතිපාදනය)

| නම | මුළු පිරිවැය (රු.) | 2014 වැය; (රු.) | 2015 වැය (රු.) | 2015.12.31 දිනට මුළු වියදම | භෞතික දියුණුව % |
|---|---|---|---|---|---|
| තාක්ෂණික ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය ප්‍රතිස්ථාපනය කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | | 7,879,766 | 8,341,737 | | |
| එකතුව | | 7,879,766 | 8,341,737 | | |

## 13. මූල්‍ය ප්‍රගති විස්තරය (වියදම්)

| විෂයය | 2015 ප්‍රතිපාදන (රුපි.) | 2015 වියදම (රුපි.) | ඉතිරිය / අතිරික්ත වැය රුපියල් |
|---|---|---|---|
| අ. ව්‍යාපෘති වැය හැර පුනරාවර්තන වැය | 124,700,000 | 131,509,304 | (6,809,304) |
| ආ. ව්‍යාපෘති වැය හැර ප්‍රාග්ධන වැය | 10,000,000 | 7,019,549 | 2,980,451 |
| ඇ. ව්‍යාපෘතිය - දේශිය අරමුදල් | | | |
| ඇ. ව්‍යාපෘතිය - විදේශිය ප්‍රතිපාදන | | | |
| එකතුව | **134,700,000** | **138,528,853** | **(3,828,853)** |

## 14. මූල්‍ය ප්‍රගති විස්තරය (උත්පාදන අදායම)

| අදායම් ප්‍රභවය | 2015 ප්‍රතිපාදන රුපි. | 2015 එකතු කිරීම් රුපි. | ඌනතාවය / අතිරික්තය රුපි. |
|---|---|---|---|
| අ. උපාධි අධ්‍යයනය | | | |
| ආ. පශ්චාත් උපාධි අධ්‍යයනය | | | |
| ඇ. උපදේශන සේවා | | | |
| ඇ. වෙනත් | 4,175,000 | 3,850,092 | (324,908) |
| එකතුව | **4,175,000** | **3,850,092** | **(324,908)** |

## 15 මූල්‍ය ප්‍රගති විශ්ලේෂණය - 2015

| විෂයය | සූත්‍රය | ඒක ශිෂ්‍ය වියදම |
|---|---|---|
| අ. ඒක ශිෂ්‍ය පුනරාවර්තන වැය (ආර්/ ඊ) | පු. වැය ශිෂ්‍ය සංඛ්‍යාව | 128,552.59 |
| ආ. ඒක ශිෂ්‍ය මූලධන වැය (සීඊ) | මූ. වැය ශිෂ්‍ය සංඛ්‍යාව | 6,861.73 |
| | | |
| මුළු මුදල | | **135,414.32** |

## 16 2015 වර්ෂයේදී ලැබුනු යටිතල පහසුකම් විස්තර

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය 2000 වර්ෂයේ සිට මොරටුව විශ්වවිද්‍යාලයේ යටිතල පහසුකම් උපයෝගී කර ගනී.

## 17 තාක්ෂණික ආයතනය ප්‍රතිස්ථාපනය කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

රු.බිලියන 10.3 කට ඇස්තමේන්තුගත මෙම ව්‍යාපෘතිය ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැඩි ඉල්ලුමක් ඇති ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සංවර්ධනය කිරීම, හා එහි ශිෂ්‍ය බඳවා ගැනීම් සංඛ්‍යාව වැඩි කිරීමට හැකි වන සේ පුළුල් කිරීම අරමුණු කරගත් ව්‍යාපෘතියකි. මේ යටතේ වසරකට බඳවා ගැනීමට අපේක්ෂිත සිසුන් සංඛ්‍යාව දහසක් වේ. දැනට මෙම සංඛ්‍යාව 350 කි.

2014 ඔක්තෝබර් මස ආරම්භ කරන ලද ආයතනය ප්‍රතිස්ථාපනය කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු ඉලක්කගත කාල සීමාවන් අනුව ක්‍රියාත්මක විය. 2015 වර්ෂය අවසන් වන විට ව්‍යුහාත්මක ඉදිකිරීම් වලින් 75% වැඩි ප්‍රමාණයක් අවසන් කර තිබින.

ව්‍යාපෘතියේ අඩංගු කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ කොටසද 2015 අගෝස්තු මස ආරම්භ විය. මූලිකව කාර්ය මණ්ඩල පුහුණුවීම් උපයෝගි කරගනු ලැබුවේ විෂය මාලා සංවර්ධනය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දැනුම පුලුල් කිරීම සදහාය. මෙසේ ලබාගත් දැනුම යොදාගනු ලැබුවේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා වැඩසටහනේ විෂය මාලා සංවර්ධනය උදෙසාය.

## 18 වෙනත් විස්තර

2015 වර්ෂය තුල අධ්‍යයන වැඩ සටහනෙහි විෂයධාරාවන් 9 යම කාල උපලේඛන නියමය අනුවම ක්‍රියාත්මක කිරිමට ආයතනයට හැකි විය.

ආයතනයේ වාර්ෂික පර්යේෂණ සම්භාෂණය, තෙවන වරටත් අඛණ්ඩවම, ඉතා සාර්ථකව 2015 ජුලි මස පැවැත්විනි.

# 19. විගනනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

තාක්ෂණික ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය

2015 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| වත්කම් | සටහන් | 2015 (රුපි) | 2015 (රුපි) | 2014 (රුපි) | 2014 (රුපි) |
|---|---|---|---|---|---|
| ජංගම වත්කම් | | | | | |
| බැංකුවේ ඇති මුදල් | 1 | 7,207,105 | | 5,210,484 | |
| ලැබිය යුතු දෑ | 2 | 10,680,294 | | 12,669,221 | |
| තොගය | | 838,504 | | 1,006,464 | |
| පෙර ගෙවීම් | 3 | 262,647 | | 253,976 | |
| අයෝජන (කෙටිකාලීන) | | 0 | 18,988,550 | 5,000,000 | 24,140,145 |
| | | | | | |
| ජංගම නොවන වත්කම් | | | | | |
| අයෝජන (දිගුකාලීන) | 4 | 14,335,190 | | 15,323,815 | |
| දේපල පිරියත හා උපකරණ | 5 | 58,196,123 | | 59,325,188 | |
| කෙරිගෙන යන වැඩ | 5(a) | 33,952,247 | | 24,438,040 | |
| වෙනත් වත්කම් | 6 | 1,525,986 | | 1,618,411 | |
| | | | 108,009,546 | | 100,705,454 |
| මුළු වත්කම් | | | 126,998,096 | | 124,845,599 |
| | | | | | |
| බැරකම් | | | | | |
| ජංගම බැරකම් | | | | | |
| ගෙවිය යුතු දෑ | 7 | 1,756,122 | | 3,344,092 | |
| අත්හිටවු අදායම් | 8 | 59,966 | | 74,307 | |
| උපචිත වියදම් | 9 | 2,798,293 | 4,614,381 | 2,354,998 | 5,773,397 |
| | | | | | |
| ජංගම නොවන බැරකම් | | | | | |
| පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන | | | 17,016,878 | | 16,170,790 |
| මුළු බැරකම් | | | (21,631,259) | | (21,944,187) |
| මුළු ශුද්ධ වත්කම් | | | 105,366,837 | | 102,901,412 |
| | | | | | |
| ශුද්ධ වත්කම් / හිමිකම් | | | | | |
| වැයවු මුලධන ආධාර | 10 | 26,677,109 | | 27,104,514 | |
| කෙරිගෙන යන වැඩ ප්‍රාග්ධන ගිණුම | 10(a) | 59,843,447 | | 51,829,240 | |
| වැයනොවු මුලධන ආධාර | 11 | 4,044,582 | | 5,905,870 | |
| පොදු සංචිතය | 12 | (16,355,724) | | (12,850,304) | |
| පරිත්‍යාග | 13 | 4,093,286 | | 4,093,286 | |
| මූල්‍ය නොවන රාජ්‍ය දීමනා | 14 | 7,250,000 | | 7,250,000 | |
| ඒකරාශි වූ අරමුදල | 15 | 19,814,137 | | 19,568,806 | |
| | | | 105,366,837 | | 102,901,412 |
| මුළු ශුද්ධ වත්කම් / හිමිකම් | | | 105,366,837 | | 102,901,412 |

**පිටු 34 සිට 40 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශන වලට අයත් කොටසකි. මෙම මුදල් ප්‍රකාශන පිළියෙල කිරීමෙන් ඉදිරිපත් කිරීමක් කළමනාකරන මණ්ඩලයේ වගකීම් වේ. ආයතනයේ කළමනාකරන මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලද්දේ:-**

| | | | |
|---|---|---|---|
| අක/ එම්.එම්.පී.ඩී සමරසේකර මිය | අක/ ජේ.කේ ලංකාතිලක මයා | අක/ එස්.පී.ඩී පිරිස් මිය | අක/එස්.ආර්.එස් උදේෂි මිය |
| අධ්‍යක්ෂතුමිය | සමාජික / කළමනාකරණ මණ්ඩලය | ජෙ.ස මූල්‍යාධිකාරී | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී |

**තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය**

**2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

| මෙහෙයුම් අදායම | සටහන | 2015(රුපි) | 2014(රුපි) |
|---|---|---|---|
| පුනරාවර්තන ආධාර | | 124,700,000 | 110,280,000 |
| රජයේ ආධාර - මහපොළ | | 5,896,400 | 2,396,600 |
| රජයේ ආධාර - ශිෂ්‍යාධාර | | 14,354,100 | 13,412,700 |
| වෙනත් අදායම් | 16 | 3,850,092 | 3,854,802 |
| ක්‍රමක්ෂය | | 7,500,730 | 6,882,136 |
| පර්යේෂණ දිරිගැන්වීමේ ආධාර | | 135,754 | 150,000 |
| නායකත්ව සංවර්ධන දීමනාව | | 50,000 | 0 |
| ශිෂ්‍ය කේන්ද්‍ර අධ්‍යයන දීමනාව | | 88,000 | 0 |
| | | 156,575,076 | 136,976,238 |
| මෙහෙයුම් වියදම් | | | |
| පෞද්ගලික වැටුප් හා වේතන | 17 | 112,840,723 | 93,526,880 |
| ගමන් වියදම් | 18 | 469,675 | 86,103 |
| සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය | 19 | 3,906,074 | 3,960,105 |
| නඩත්තු කිරීමේ වියදම් | 20 | 1,518,939 | 2,549,932 |
| ගිවිසුම් සේවා | 21 | 1,719,164 | 3,832,023 |
| පර්යේෂණ හා සංවර්ධන වියදම් | 22 | 634,189 | 725,340 |
| කාලය සහ ක්‍රමක්ෂය වියදම් | | 8,295,730 | 7,677,136 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 23 | 10,420,540 | 9,341,455 |
| මහපොළ | | 5,896,400 | 2,396,600 |
| ශිෂ්‍යාධාර | | 14,354,100 | 13,412,700 |
| පර්යේෂණ දිරිගැන්වීමේ වියදම් | | 135,754 | 150,000 |
| නායකත්ව සංවර්ධන වියදම් | | 50,000 | 0 |
| ශිෂ්‍ය කේන්ද්‍ර අධ්‍යයන වියදම් | | 88,000 | 0 |
| මුළු මෙහෙයම් වියදම් | | 160,329,288 | 137,658,274 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඇතිවුනු අතිරික්තය / ඌනතාවය | | (3,754,212) | (682,036) |

අක / එස්.පී.ඩී පීරිස් මිය

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

## තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය
## 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | සටහන | 10<br>වැයවූ මූලධන ආධාර | 10a<br>ඉඩම සඳහා ගෙවීම් | 11<br>වැයනොවූ මූලධන ආධාර | 12<br>පොදු සංචිතය | 13<br>පරිත්‍යාග | 14<br>මුදල් නොවන රජයේ ආධාර | 15<br>එක්රැස්වූ අරමුදල | මුළු මුදල |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | | 31,442,352 | 37,784,571 | 15,469,651 | (13,772,390) | 3,975.000 | 7,250,000 | 20,669,842 | 102,819,026 |
| මූල්‍ය ප්‍රගති ප්‍රකාශනයන්හි සඳහන් නොවූ ශුද්ධ ලාභ සහ පාඩු | | (7,749,735) | 6,811,735 | | 1,604,122 | | | | 666,122 |
| මාරු කිරීම් / ශුද්ධ චලනයන් | | 9,499,033 | 7,232,934 | (9,563,781) | | 118,286 | | (1,101,036) | 6,185,436 |
| කාල සීමාව තුල අතිරික්තය / ඌනතාවය | | | | | (682,036) | | | | (682,036) |
| ක්‍රමක්ෂය | | (6,087,136) | | | | | | | (6,087,136) |
| 2014 දෙසැම්බර් දිනට ශේෂය | | 27,104,514 | 51,829,240 | 5,905,870 | 12,850,304 | 4,093,286 | 7,250,000 | 19,568,806 | 102,901,412 |
| දේපල ප්‍රත්‍යාගනනයෙන් පසු අතිරික්තය / ඌනතාවය | | | | | | | | | 0 |
| මාරුකිරීම් ශුද්ධ චලනයන් | | 7,073,325 | 8,014,207 | (1,861,288) | | | | 245,331 | 13,471,575 |
| මූල්‍ය ප්‍රගති ප්‍රකාශනයන්හි සඳහන් නොවූ ශුද්ධ ලාභ සහ පාඩු | | 0 | 0 | | 248792 | | | | 248,972 |
| ක්‍රමක්ෂය | | (7,500,730) | | | | | | | (7,500,730) |
| අදාල කාලය සඳහා අතිරික්තය / ඌනතාවය | | | | | (3,754,212) | | | | (3,754,212) |
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | | 26,677,109 | 59,843,447 | 4,044,582 | (16,355,724) | 4,093,286 | 7,250,000 | 19,814,137 | 105,366,837 |

අක / එස්.පී.ඩී පීරිස් මිය /ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

## තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය
## 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ සටහන

| මෙහෙයුම් ක්‍රියාකාරීත්වයන් තුල මුදල් ප්‍රවාහයන් | සටහන් | | **2015** | | **2014** |
|---|---|---|---|---|---|
| | | රුපි | රුපි | රුපි | රුපි |
| අතිරික්තය / ඌනතාවය සාමාන්‍ය ක්‍රියාකාරීත්වය තුලින් | | (3,754,212) | | (682,036) | |
| <u>මුදල් නොවන සංචලනය</u> | | | | | |
| ක්ෂය වීම් | | **8,295,730** | | 7,677,136 | |
| ක්‍රමක්ෂය | | (7,500,730) | | (6,882,136) | |
| අතිරික්තය / (ඌනතාවය) පාරිතෝෂික වෙන්කිරීම් | | **846,088** | | 637,834 | |
| වෙනත් ගැලපීම් | 25 | **274,875** | | 2,401,208 | |
| <u>අතිරික්තය / (ඌනතාවය) කාරක ප්‍රාග්ධනය</u> | | | | | |
| (ඌනතාවය / අතිරික්තය) ලැබීම් | 26 | **2,148,216** | | 1,394,898 | |
| අතිරික්තය / (ඌනතාවය) අත්හිටවූ ආදායම | | **(14,341)** | | 36,213 | |
| අතිරික්තය / (ඌනතාවය) ගෙවීම් | 27 | (1,587,970) | | (2,322,881) | |
| (ඌනතාවය) / අතිරික්තය උපචිත වියදම් | | **443,295** | | (2,193,147) | |
| මෙහෙයුම් ක්‍රියාවන් තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | | **(876,049)** | | 67,089 |
| <u>ආයෝජන මුදල් ප්‍රවාහය</u> | | | | | |
| යාන්ත්‍රෝපකරන සහ උපකරණ මිලදී ගැනීම් (උපලේඛන ඩී සහ ඊ) | | (6,745,795) | | (8,944,013) | |
| ඉඩම් සඳහා ගෙවීම් (ප්‍රාග්ධන) | | (8,341,737) | | (7,879,766) | |
| වෙනත් ව්‍යාපෘති සඳහා ගෙවීම් | | **(273,754)** | | | |
| ආයෝජන ක්‍රියා තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | | (15,361,286) | | (16,823,779) |
| <u>මුල්‍යමය ක්‍රියාකාරකම් තුල මුදල් ප්‍රවාහය</u> | | | | | |
| මුලධන ආධාර | 11 | 12,000,000 | | 7,000,000 | |
| අතිරික්තය / ඌනතාවය විශේෂිත අරමුදල් | | **245,331)** | | (1,101,036) | |
| අතිරික්තය / ඌනතාවය ආධාර | | **0** | | 118,286 | |
| මුල්‍ය කටයුතු තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | | **12,245,331** | | 6,017,250 |
| ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) මුදල් සහ මුදල් සමතාව | | | **(3,992,004)** | | (10,739,440) |
| අදාල කාලය ආරම්භයේ මුදල් සහ මුදල් සමතාව | | | **25,534,299** | | 36,273,739 |
| අදාල කාලය අවසානයේ මුදල් සහ මුදල් සමතාව | 28 | | 21,542,295 | | 25,534,299 |

**අක / එස්.පී.ඩී පීරිස් මිය**
**ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී**

# 20. විගණන කොමිටු වාර්තාව

<u>අභ්‍යන්තර විගණන වාර්තාව</u>

විගණකාධිපතිගේ එකගත්වය ඇතිව, වැදගත් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විගණන කොමිටුවේ සහ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලත් 2015 වර්ෂය සඳහා වූ වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව, පහත සඳහන් ආකාරයට මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ විගණන කටයුතු, අභ්‍යන්තර විගණන අංශය විසින් ක්‍රියාත්මක කරන ලදී.

1 පූර්ව විගණනය

- විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම (යූ.පී.එෆ්)
- පාරිතෝෂික දීමනා ගෙවීම්.
- විශ්‍රාම අරමුදල් නිදහස් කිරීම.
- බැදුම්කර ගණනය කිරීම.

2 සොයා ගැනීම් මත නිදහස් කරන ලද විගණන විමසීම්.

- ශිෂ්‍යාධාර ගෙවීම් වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම.
- 2015 ගෙවීම් වවුචර් නියැදි ලෙස පරීක්ෂා කිරීම

3 ක්‍රියාත්මක කරන ලද වෙනත් විගණන පරීක්ෂණ

- මිලදී ගැනීම් ඇනවුම් නියැදි ලෙස පරීක්ෂා කිරීම.
- බැංකු සැසදුම් සටහන් පරීක්ෂා කිරීම.
- විවිධ අත්තිකාරම් පරීක්ෂා කිරීම.

4 විගණන කමිටුව

මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ විගණන කොමිටුව, තෙමසකට වරක්වත් ආයතනයේ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම සඳහා රැස්වෙයි. මෙම කොමිටුව විගණන වාර්තා මෙන්ම විගණකාධිපති තුමා විසින් යොමු කරනු ලබන විගණන විමසීම් පිළිබඳ තාක්ෂණික ආයතනයේ ප්‍රති පිලිතුරු සලකා බලනු ලැබේ. කොමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කරනු ලබන අතර වරද නිවැරදි කිරීම් පිණිස මග පෙන්වීම් ලබාදෙන අතර ඒවා අධීක්ෂණයද කරනු ලැබේ.

විගණන කොමිටිය සමාලෝචනයට යොමුවන වර්ෂය තුල හතර වතාවක් රැස්වී ඇත.

5 කාර්යය මණ්ඩලය

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු තාක්ෂණික ආයතනය විසින් යොමුකරවනු ලබන ලිපිකරුවකු විසින් මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණන නිළධාරිගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ. මොරටුව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය තාක්ෂණික ආයතනයේ විගණන කටයුතු ඉටු කිරීම සඳහා සහාය දෙනු ලැබේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

Institute Of ... Finance Division 06 0... University Of Moratuwa

මගේ අංකය / எனது இல. / My No. එච්ඊඩී/සී/අයිටියුඑම්/1/15/02 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016 සැප්තැම්බර් 29 දින

අධ්‍යක්ෂ,

තාක්ෂණික ආයතනය,

මොරටුව විශ්වවිද්‍යාලය.

**මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108 (2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂක වෙත 2016 ජූනි 26 වන දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වන වගන්තිය මගින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ප්‍රයෝජනවත් ජීවිත කාලය හඳුනාගැනීමේදී සිදුවූ දෝෂ හේතුවෙන් පිරිවැය රු.47,450,180 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

රාජ්‍ය ප්‍රදාන යටතේ මිලදී ගන්නා වත්කම්වල ක්ෂය කිරීම සම්බන්ධව ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය ගිණුම් මගින් අනාවරණය කර නොතිබූ අතර 2011 සහ 2012 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.7,250,000 ක ශුද්ධ අගය සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.1,901,167 ක් දක්වා අඩුවී තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය උපලේඛනය සමඟ සැසඳීමේදී රු.891,200 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව දිගුකාලීන ආයෝජනවල වටිනාකම රු.14,335,190 ක් වුවද, ඉදිරිපත් කර ඇති විස්තරාත්මක සටහන්වල වටිනාකම රු. 14,164,403 ක් ලෙස දැක්වීම නිසා රු. 170,787 වෙනසක් විය.

### 2.3 ලැබිය යුතු ගිණුම්

ගිවිසුම් කඩකල නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.3,481,830 ක මුදල අර්ථ සාධක අරමුදලින් අයකර ගැනීමේ එකඟතාවය පලකර තිබුණද, 2015 දෙසැම්බර් 31 වන විටත් එම මුදල් අය කර ගෙන නොතිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | |
| XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.64,883,895 ක් පාරිශ්‍රමික ගෙවා තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ආයතන සංග්‍රහය

| | |
|---|---|
| XXIV පරිච්ඡේදයේ 4.2.5 උපවගන්තිය | 2012 මැයි මාසයේදී සේවයෙන් ඉල්ලා අස් වූ නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.38,080 ක ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අය කර ගෙන නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් රු.3,754,212ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.682,036 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ඌනතාවය රු.3,072,176 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන රු.14,420,000 කින් වැඩිවී තිබුණද පුද්ගලික පාරිශ්‍රමිකය රු.19,313,843 කින් වැඩිවීම ඌනතාවය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂ 05 තුළ මූල්‍ය ප්‍රතිඵල සලකා බැලීමේදී 2012,2014 හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය ඌනතාවයක් පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා රාජ්‍ය බදු සඳහා ගැලපීම් කිරීමෙන් පසු දායකත්වයේ වර්ධනයක් පෙන්නුම් කෙරෙන අතර එය සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.11,152,226 ක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අනුව නියම කරනු ලබන අධ්‍යයන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය ලබාදීම, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ මූලික කාර්යය විශ්ව විද්‍යාලයකින් ආවරණය කරන අතර තාක්ෂණික ආයතනය පීඨ හතරකින් සමන්විතව තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 1220 ක් විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් වසරේ පවත්වන ලද විභාග ප්‍රතිඵල අනුව විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 430 ක් වන අතර ඉන් සිසුන් 296 ක් එනම් සියයට 69ක් විභාගය සමත්ව තිබූ අතර සිසුන් 134 ක් එනම් සියයට 31 ක් විභාගය අසමත් වී තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේ එක් එක් අධ්‍යයනාංශවල සිසුන් පළමු වසර විභාගය සියයට 85 ක් සමත් වෙතැයි අපේක්ෂා කළද සමත්ව තිබූ ප්‍රතිශතය සියයට 62 ත් සියයට 74 ත් අතර වූ බැවින් අපේක්ෂිත ඉලක්ක ඉටු වී නොතිබුණි.

## 4.2 අරමුදල් ඌන උපයෝජනය

පර්යේෂණ හා සංවර්ධන සහ තාක්ෂණ ආයතන සංවර්ධන අරමුදල් දෙකෙහි වටිනාකම වන රු.693,002 ක් කිසිදු කාර්යයකට නොයොදා වසර 10 ක පමණ කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තාක්ෂණ ආයතනයේ විගණන කටයුතු මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකගේ සුපරීක්ෂණය යටතේ තාක්ෂණ ආයතනයෙන් අනුයුක්ත කරන ලද එක් ලිපිකරුවෙකු මගින් ඉටුකරනු ලැබේ.මෙය අභ්‍යන්තර විගණන අංශයේ කාර්යක්ෂමතාව සහ ඵලදායිත්වය අඩුවීම කෙරෙහි බලපා තිබුණි.

(ආ) සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රමවල ප්‍රගතිය නිශ්චය කිරීම, ව්‍යාපෘති සම්බන්ධව ගැටලු ක්ෂේත්‍රයන් සලකා බැලීම්, ස්ථානීය පරීක්ෂා කිරීම් සිදු කිරීම යනාදිය අභ්‍යන්තර විගණන අංශයෙන් ආවරණය වී නොතිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් රු. 4,000,000 වූ උපකරණ අයිතමයන් 18 ක් සහ රු. 500,000 වටිනා පොත් තොගයක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (ආ) වත්කම් කළමනාකරණය | වත්කම් සාධාරණ අගයන්ට ගිණුම්වල හෙළිදරව් නොකිරීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | ගිවිසුම් කඩකල නිලධාරීන්ට එරෙහිව කඩිනමින් ක්‍රියා නොකිරීම හා පවත්නා නීතිරීති වලට අනුව කටයුතු නොකිරීම.<br>ණය අයකිරීම් විධිමත් කර කඩිනමින් අය කිරීමට කටයුතු නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහිත එහි කටයුතු පිළිබඳ 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වන වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්ථාවට පිළිතුරු පහත සඳහන් කරනු කැමැත්තෙමි.

| විගනන මතය | පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| **2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම | **2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම |
| **2.2.1** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති | **2.2.1** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ප්‍රයෝජනවත් ජීවිත කාලය හඳුනාගැනීමේදී සිදුවූ දෝෂ හේතුවෙන් පිරිවැය රු.47,450,180 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට 2015-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදු කරන ලද වත්කම් සමීක්ෂණය පිළිබඳ වාර්තා සැලකිල්ලට ගනිමින්, භාවිතයට නුසුදුසු වත්කම් හඳුනාගෙන ඇති අතර මේ දිනවල එම වත්කම් අපහරණයට අදාල කටයුතු සිදුකරමින් පවතී. වත්කම් ප්‍රත්‍යාගණනය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 53 වන විගණන කමිටුවේ උපදෙස් පරිදි ආයතනික කමිටුවක් පත් කිරීමට පියවර ගෙන ඇති අතර 2016-12-31 දින වන විට ප්‍රත්‍යාගණන කටයුතු නිම කිරීමට පියවර ගනු ඇත. |
| **2.2.2** ගිණුම්කරණ ප්‍රතිපත්ති | **2.2.2** ගිණුම්කරණ ප්‍රතිපත්ති |
| රාජ්‍ය ප්‍රදාන යටතේ මිලදී ගන්නා වත්කම්වල ක්ෂය කිරීම සම්බන්ධව ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්ති ගිණුම් මගින් අනාවරණය කර නොතිබු අතර 2011 සහ 2012 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලැබී තිබු රු. 7,250,000 ක ශුද්ධ අගය සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.1,901,167 ක් දක්වා අඩුවී තිබුණි. | මුදල්මය නොවන රාජ්‍ය ප්‍රධාන යටතේ ලැබී ඇති වාහන සම්බන්ධයෙන් ක්‍රමක්ෂය කිරීම පිළිබඳව ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය 2016 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට සටහන් තබා ගන්නා ලදී. |
| **2.2.3** පැහැදිලි නොකල වෙනස්කම් | **2.2.3** පැහැදිලි නොකල වෙනස්කම් |
| පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.<br>(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය උපලේඛනය සමග සැසදීමේදී රු.891,200 ක වෙනසක් විය. | (අ) කෙරීගෙන යන වැඩ උපලේඛනය සඳහා ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය වෙත, ගෙවූ තැන්පතු මුදල වන රුපියල් 2,391,200.00 ක මුදල සහ උසස් අධ්‍යාපන අමාත්‍යංශයෙන් ලැබී එම අමාත්‍යංශය වෙත ආපසු ගෙවූ රුපියල් 1,500,000.00 ක මුදල ගැලපූ පසු මෙම 891,200.00 ක වෙනස ශුන්‍ය අගයක් ගනී. |

<table>
<tr><th>විගනන මතය</th><th>පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග</th></tr>
<tr><td>(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව දිගුකාලීන ආයෝජනවල වටිනාකම රු.14,335,190 ක් වුවද, ඉදිරිපත් කර ඇති විස්තරාත්මක සටහන්වල වටිනාකම රු. 14,164,403 ක් ලෙස දැක්වීම නිසා රු.170,787 වෙනසක් විය.</td><td>(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ව ප්‍රකාශයට අනුව දිගුකාලීන ආයෝජන වටිනාකම රු. 14,335,190.00 මූල්‍ය ප්‍රකාශන වල පිටු අංක 10 හි සදහන් වන සටහන් අංක 04 හා සැසදෙන අතර පිටු අංක 36 හි සදහන් විස්තරාත්මක සටහන් වලද එම අගය සදහන් විය යුතු වුවත් වැරදීමකින් රු. 14,164,403.00 ලෙස සටහන්ව ඇත.</td></tr>
<tr><td>2.3 ලැබිය යුතු ගිණුම්</td><td>2.3 ලැබිය යුතු ගිණුම්</td></tr>
<tr><td>ගිවිසුම් කඩකල නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.3,481,830 ක මුදල අර්ථ සාධක අරමුදලින් අයකර ගැනීමේ එකගතාවය පලකර තිබුණද, 2015 දෙසැම්බර් 31 වන විටත් එම මුදල් අයකර ගෙන නොතිබුණි.</td><td>තාක්ෂණික ආයතනය අධ්‍යක්ෂතුමියගේ 2015.01.06 දිනැති හා ITUM/ACI/PF/10 අංක දරණ ලිපිය අනුව ගිවිසුම් කඩකල නිලධාරියාගෙන් අයවිය යුතු මුදල රු. 1,561,148.33 ක් වන අතර මෙම මුදල අයකර ගැනීම සදහා අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ පෝරම 2016-08-26 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යවා ඇත.</td></tr>
<tr><td>2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</td><td>2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</td></tr>
<tr><td>පහත සදහන් අනුකූල නොවීම් අවස්ථා නිරික්ෂණය විය.</td><td></td></tr>
<tr><td><table>
<tr><td>නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව</td><td>අනුකූල නොවීම</td></tr>
<tr><td>(අ) විශ්වවිද්‍යාල ප්‍රතාපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සදහා වූ ආයතන සංග්‍රහය</td><td></td></tr>
</table></td><td></td></tr>
</table>

<table>
<tr><th>විගනන මතය</th><th>පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග</th></tr>
<tr><td><table>
<tr><td>XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය</td><td>අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සදහා රු. 64,883,895 ක් පාරිශ්‍රමික ගෙවා තිබුණි.</td></tr>
<tr><td>(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය</td><td></td></tr>
<tr><td>XXIV පරිච්ඡේදයේ 4.2.5 උපවගන්තිය</td><td>2012 මැයි මාසයේදී සේවයෙන් ඉල්ලා අස්වූ නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.38,080 ක ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අයකර ගෙන නොතිබුණි.</td></tr>
</table></td><td>(අ) විශ්වවිද්‍යාල පද්ධතිය අනුගමනය කරන ක්‍රමවේදයම තාක්ෂණික ආයතනයටද අදාල විය යුතු නිසා මේ පිළිබදව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් පරිදි කටයුතු කර ඇත.<br><br>(ආ) 2012 මැයි මාසයේදී සේවයෙන් ඉල්ලා අස් වූ නිලධාරියෙකුගෙන්අයවිය යුතු රු. 38,080 ක ශේෂය අයකර ගැනීම සදහා අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ පෝරම 2016-08-26 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යවා ඇත.</td></tr>
<tr><td>3. මුල්‍ය සමාලෝචනය</td><td>3. මුල්‍ය සමාලෝචනය</td></tr>
<tr><td>3.1 මුල්‍ය ප්‍රතිඵල</td><td>3.1 මුල්‍ය ප්‍රතිඵල</td></tr>
<tr><td>ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් රු. 3,754,212 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 682,036 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ඌනතාවය රු.3,072,176 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ</td><td>එකග වෙමි.<br><br>තාක්ෂණික ආයතනය අදායම් බද්දෙන් නිදහස් බැවින් බදු පෙර හා බදු පසු ශුද්ධ ලාභයක් ගණනය නොකරන අතර අතිරික්තයක් හා ඌනතාවයක් පමණක් ගණනය කරයි.</td></tr>
</table>

| විගනන මතය | පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන රු.14,420,000 කින් වැඩි වී තිබුණ ද පුද්ගලික පාරිශ්‍රමිකය රු. 19,313,843 කින් වැඩිවීම ඌනතාවය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.<br>ඉකුත් වර්ෂ 05 තුළ මූල්‍ය ප්‍රතිඵල සලකා බැලීමේදී 2012,2014 හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය ඌනතාවයක් පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා රාජ්‍ය බදු සඳහා ගැලපීම් කිරීමෙන් පසු දායකත්වයේ වර්ධනයක් පෙන්නුම් කෙරෙන අතර එය සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. 11,152,226 ක් විය. | |
| **4.** මෙහෙයුම් සමාලෝචනය | **4.** මෙහෙයුම් සමාලෝචනය |
| **4.1** කාර්යසාධනය | **4.1** කාර්යසාධනය |
| පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | |
| 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අනුව නියම කරනු ලබන අධ්‍යයන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය ලබාදීම, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරිමේ මූලික කාර්යය විශ්වවිද්‍යාලයකින් ආවරණය කරන අතර තාක්ෂණික ආයතනය පීඨ හතරකින් සමන්විතව තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 1220 ක් විය.<br>(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් වසරේ පවත්වන ලද විභාග ප්‍රතිඵල අනුව විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 430 ක් වන අතර ඉන් සිසුන් 296 ක් එනම් සියයට 69 ක් විභාගය සමත්ව තිබූ අතර සිසුන් 134 ක් එනම් සියයට 31 ක් විභාගය අසමත් වී තිබුණි. | තාක්ෂණික ආයතනය අධ්‍යයන අංශ 05 කින් සමන්විත වන අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එහි සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 1023 ක් වේ.<br>(අ) විභාග ප්‍රතිඵල විශ්ලේශනය සඳහා සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රමවේදයට අනුව යොදා ගැනෙනුයේ විභාගයක් සඳහා පළමුවරට පෙනී සිටින සිසුන් සංඛ්‍යාවයි. ඒ අනුව සිසුන් 345 දෙනෙකු අදාල විභාගය සඳහා පළමු වරට පෙනී සිට ඇති අතර එයින් 260 ක් එනම් 75% විභාගය සමත් වී ඇත. විභාගය සම්පූර්ණයෙන්ම අසමත් සිසුන් හා විෂයයන් එකක් හෝ දෙකක් සම්පූර්ණ කල යුතු සිසුන්ගේ එකතුව ඉතිරි 25% ට ඇතුලත් වේ. |

| විගනන මතය | පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| (ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේ එක් එක් අධ්‍යයනාංශවල සිසුන් පළමු වසර විභාගය 85% ක් සමත් වෙතැයි අපේක්ෂා කළද සමත්ව තිබූ ප්‍රතිශතය 62% ත් 74% ත් අතර වූ බැවින් අපේක්ෂිත ඉලක්ක ඉටු වී නොතිබුණි. | (ආ) සිසුන්ගේ විභාග ප්‍රතිඵල කෙරෙහි විවිධ වූ කරුණු බලපාන අතර, ක්‍රියාකාරී සැලැස්ම අනුව විභාගය සමත් වෙතැයි අපේකෂිත ප්‍රතිශතය 85% ලෙස දක්වා ඇත්තේ සිවුශේෂී වූ වර්ෂයක විභාග ප්‍රතිඵල ආශ්‍රයෙනි. සමාලෝචිත වර්ෂයේ සිසුන්ගේ විභාගය සමත්වීමේ ප්‍රතිශතය 62% සිට 76% දක්වා විචලනය වීමට බලපා ඇති විවිධ කරුණු අතර අදාල ශිෂ්‍ය කණ්ඩායමේ කුසලතාවයද විශේෂිත වේ.<br>සමත්වීමේ ප්‍රතිශතය ඉහල නංවා ගැනීම සඳහා ආයතනය විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් පවති. |
| 4.2 අරමුදල් ඌන උපයෝජනය | 4.2 අරමුදල් ඌන උපයෝජනය |
| පර්යේෂණ හා සංවර්ධන සහ තාක්ෂණ ආයතන සංවර්ධන අරමුදල් දෙකෙහි වටිනාකම වන රු.693,002 ක් කිසිදු කාර්යයකට නොයොදා වසර 10 ක පමණ කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි. | පර්යේෂණ හා සංවර්ධන සහ තාක්ෂණ ආයතන සංවර්ධන යන අරමුදල් සඳහා නිර්නායක සකසමින් පවතින අතර ඉදිරියේදී අවශ්‍ය කටයුතු කිරීමට සටහන් තබා ගන්නා ලදී. |
| 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය | 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය |
| 5.1 අභ්‍යන්තර විගණනය | 5.1 අභ්‍යන්තර විගණනය |
| පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | |
| (අ) තාක්ෂණ ආයතනයේ විගණන කටයුතු මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකගේ සුපරීක්ෂණය යටතේ තාක්ෂණ ආයතනයෙන් අනුයුක්ත කරන ලද එක් ලිපිකරුවෙකු මගින් ඉටුකරනු ලැබේ. මෙය අභ්‍යන්තර විගණන අංශයේ කාර්යක්ෂමතාව සහ ඵලදායිත්වය අඩුවීම කෙරෙහි බලපා තිබුණි. | (අ) දැනට තාක්ෂණ ආයතනයේ විගණන කටයුතු මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගනකගේ සුපරීක්ෂණය යටතේ තාක්ෂණ ආයතනයෙන් අනුයුක්ත කරන ලද එක් ලිපිකරුවෙකු මගින් ඉටුකරනු ලැබේ. වර්තමානයේදී මෙම ලිපිකරු අභ්‍යන්තර ස්ථාන මාරුවීම් වලට යටත් නොවේ.<br>තාක්ෂණික ආයතනය දියගම පරිශ්‍රයේ ස්ථාපිත කිරීමෙන් පසු එහි ඇතිවන අභ්‍යන්තර විගණන අංශය සඳහා සේවක අවශ්‍යතාවයන් ඉල්ලීම් කර ඇත. ඒ අනුව විගණන අංශය වඩාත් ශක්තිමත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

<table>
<tr><th>විගනන මතය</th><th>පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග</th></tr>
<tr><td>(ආ) සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රමවල ප්‍රගතිය නිශ්චය කිරීම, ව්‍යාපෘති සම්බන්ධව ගැටලු ක්ෂේත්‍රයන් සලකා බැලීම, ස්ථානීය පරීක්ෂා කිරීම් සිදු කිරීම යනාදිය අභ්‍යන්තර විගණන අංශයෙන් ආවරණය වී නොතිබුණි.</td><td>(ආ) මේ වන විට අභ්‍යන්තර විගණන අංශයේ කාර්යය මණ්ඩලයට විගණන සහකාර නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව ඉදිරියේදී ව්‍යාපෘති සම්බන්ධ විගණන කටයුතුද අභ්‍යන්තර විගණන වැඩසටහනට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.</td></tr>
<tr><td>5.2 ප්‍රසම්පාදන සැලැස්ම</td><td>5.2 ප්‍රසම්පාදන සැලැස්ම</td></tr>
<tr><td>සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් රු.4,000,000 වූ උපකරණ අයිතමයන් 18 ක් සහ රු.500,000 වටිනා පොත් තොගයක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි.</td><td>ඔබ විසින් ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම යන මැයෙන් එවන ලද අංක එච්ඊඩී/සී/අයිටීයූඑම්/2/15/සී/04 දරන විගණන විමසුමෙහි අගයන් නිවැරදි නොවන අතර එය පහත ආකාරයෙන් නිවැරදි විය යුතුය.
<table>
<tr><th>වත්කම්</th><th>ඒකක ප්‍රමාණය</th><th>අයවැය ගත පිරිවැය</th></tr>
<tr><td>Photocopier</td><td>02</td><td>1,000,000</td></tr>
<tr><td>Equipment for Divison of E’trical& E’tronic</td><td>17</td><td>8,500,000</td></tr>
<tr><td>Books</td><td>-</td><td>500,000</td></tr>
</table>
තවද මෙම අගයන් ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් වූ අයවැය ඇස්තමේන්තුවේ සඳහන් අයිතම 03 ක් පමණක් වූ අතර ඒ සඳහා මුළු අයවැය ඇස්තමේන්තුව රුපියල් මිලයන 20.6 ක් විය. නමුත් 2015 වර්ෂයේ මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදනය වුයේ රුපියල් මිලියන 7 කි. මෙම මිලියන 7 ට ආදාලව 2015 වර්ෂයේ ස්ථාවර වත්කම් අත්පත් කරගෙන ඇත.</td></tr>
</table>

<table>
<tr><td>විගනන මතය</td><td>පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග</td></tr>
<tr><td>6. පද්ධති හා පාලනයන්</td><td>6. පද්ධති හා පාලනයන්</td></tr>
<tr><td>විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.
<table>
<tr><td>පද්ධති හා පාලන ක්ෂේත්‍ර</td><td>නිරීක්ෂණ</td></tr>
<tr><td>(අ) වත්කම් කළමනාකරණය</td><td>වත්කම් සාධාරණ අගයන්ට ගිණුම්වල හෙළිදරව් නොකිරීම</td></tr>
<tr><td>(ආ) කාර්ය මණ්ඩල පරිපාලන</td><td>ගිවිසුම් කඩකල නිලධාරින්ට එරෙහිව කඩිනමින් ක්‍රියා නොකිරීම හා පවත්නා නීතිරීති වලට අනුව කටයුතු නොකිරීම.<br>ණය අයකිරීම් විධිමත් කර කඩිනමින් අය කිරිමට කටයුතු නොකිරීම.</td></tr>
</table></td><td>(අ) වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා පියවර ගෙන ඇත.<br><br>(ආ) මෙම නිලධාරීන් විදේශගතව සිටීම නිසා අපගේ පරිපාලනයෙන් තොරව ඇතිවන සන්නිවේදන කටයුතු වල ප්‍රමාදය නිසා මෙලෙස එම නිලධාරීන් සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියා මාර්ග ගැනීමට අපහසු වී ඇත. ඉදිරියේදී මෙම කාලසීමාව හැකිතාක් දුරට අවම කරගැනීමට කටයුතු කරනු ඇත.<br>මෙවැනි නිළධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ හැකි ඉක්මනින් ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.</td></tr>
</table>

එම්.එම්.පි.ඩී සමරසේකර

අධ්‍යක්ෂ

තාක්ෂණික ආයතනය

මොරටුව විශ්වවිද්‍යාලය